# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,545 — 1958 ඔක්තෝබර් 3 වැනි සිකුරාද — 3.10.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 843 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 844 | මාගී කොම්පි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 849 |


## පළාත් පාලන නිවේදන

ඇල්. ඕ. බී.—139/46.
ඇල්. ජී. බී.—ජී ඒ 29/1.

### 1946යේ අංක 12 දරන විනෝද බද්ද පිළිබඳ ආඥාපනත

1946 අංක 12 දරණ විනෝද බද්ද පිළිබඳ ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩගම්පහ ගම් ප්‍රදේශයේ ගම්කාය්‍යී සභාව විසින් සම්මත කරගන්නා ලද පහත දැක්වෙන සංශෝධිත යෝජනාව පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් අනුමත කර තිබේ. එකී වගන්තියේ (2) වැනි උප වගන්තියේ ප්‍රකාර එය මෙහි පළ කරනු ලැබේ.

#### යෝජනාව

"1946යේ අංක 12 දරන විනෝද බද්ද පිළිබඳ ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙම ගම්කාය්‍යී සභාව විසින් මේ යෝජනාව "ගැසට්" පත්‍රයේ පළවන දින සිට ගම් ප්‍රදේශයේ කාය්‍යී සභාවේ පාලන බල සීමාව ඇතුළත පැවැත්වෙන (ආඥාපනතේ විස්තරකර තිබෙන) විනෝදය සඳහා ප්‍රවේශවීම පිණිස අයකරනු ලබන ගෙවීම් වලින් මෙහි පහත දැක්වෙන ශ්‍රේණි ගණන් අනුව බද්දක් පණවා අයකරනු ලැබේ:—

#### අයකිරීම

| | බද්දේ ශ්‍රේණි ගණන රු. ශ. |
|---|---|
| බද්ද හැර ඇතුලත්වීමේ ගාස්තුව:— | |
| (අ) ශත 20ට අඩු නොවන්නාවූ එහෙත් ශත 50ට වැඩි නොවන්නාවූ විට ... ... | 0 5 |
| (ආ) ශත 50ට වැඩි වන්නාවූ එහෙත් රු. 1ට වැඩි නොවන්නාවූ විට ... ... | 0 10 |
| (ඇ) රු. 1ට වැඩි වන්නාවූ එහෙත් රු. 1.50ට වැඩි නොවන්නාවූ විට ... ... | 0 15 |
| (ඈ) රු. 1.50ට වැඩි වන්නාවූ එහෙත් රු. 2ට වැඩි නොවන්නාවූ විට ... ... | 0 20 |
| (ඉ) රු. 2ට වැඩි වන්නාවූ එහෙත් රු. 3ට වැඩි නොවන්නාවූ විට ... ... | 0 30 |
| (ඊ) රු. 3ට වැඩි වන්නාවූ එහෙත් රු. 4ට වැඩි නොවන්නාවූ විට ... ... | 0 40 |
| (උ) රු. 4ට වැඩි වන්නාවූ එහෙත් රු. 5ට වැඩි නොවන්නාවූ විට ... ... | 0 50 |
| (ඌ) රු. 5ට වැඩි වන්නාවූ එහෙත් රු. 10ට වැඩි නොවන්නාවූ විට ... ... | 1 00 |
| (එ) රු. 10ට වැඩිවූ විට— | |
| (1) 1 වැනි රු. 10ට ... ... | 1 00 |
| (2) ඉන් වැඩිවූ එක් එක් රු. 5ට හෝ ඉන් කොටසකට ... ... | 1 00" |

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 සැප්තැම්බර් 17 වැනි දින,
කොළඹදීය.

ඇල්.ඕ.—බී 139/46/ජීජේ 23/2/1.

## 1946යේ අංක 12 දරන විනෝද බද්ද පිළිබඳ ආඥාපනත

(2) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ රත්නපුරය දිස්ත්‍රික්කයේ හෙල උඩ පළාත ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත දැක්වෙන යෝජනාව පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අනුමත කර තිබේ. එකී වගන්තියේ (2) වැනි උප වගන්තියේ ප්‍රකාර එය මෙහි පළකරනු ලැබේ.

### යෝජනාව

1946යේ අංක 12 දරණ විනෝද බද්ද පිළිබඳ ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙම කාර්‍ය සභාව විසින් මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට මෙම කාර්‍ය සභාවේ පාලන බල සීමාව ඇතුළත පැවැත්වෙන (ආඥාපනතේ විස්තර කර තිබෙන) විනෝද සඳහා ප්‍රවේශවීම පිණිස අයකරනු ලබන ගෙවීම් වලින් පහත දැක්වෙන රේට් ගණන් අනුව බද්දක් මෙයින් පනවා අයකරනු ලැබේ :—

### ගෙවන මුදල

| | බද්දේ රේට් ගණන රු. ශ. |
|---|---|
| බද්ද හැර ඇතුලත්වීමේ ගාස්තුව :— | |
| (අ) ශත 20ට අඩු නොවන්නාවූ එහෙත් ශත 50ට වැඩි නොවන්නාවූ විට ... ... | 0 5 |
| (ආ) ශත 50ට වැඩි වන්නාවූ එහෙත් රු. 1ට වැඩි නොවන්නාවූ විට ... ... | 0 10 |
| (ඇ) රු. 1ට වැඩි වන්නාවූ එහෙත් රු. 1.50ට වැඩි නොවන්නාවූ විට ... ... | 0 15 |
| (ඈ) රු. 1.50ට වැඩි වන්නාවූ එහෙත් රු. 2ට වැඩි නොවන්නාවූ විට ... ... | 0 20 |
| (ඉ) රු. 2ට වැඩි වන්නාවූ එහෙත් රු. 3ට වැඩි නොවන්නාවූ විට ... ... | 0 30 |
| (ඊ) රු. 3ට වැඩි වන්නාවූ එහෙත් රු. 4ට වැඩි නොවන්නාවූ විට ... ... | 0 40 |
| (උ) රු. 4ට වැඩි වන්නාවූ එහෙත් රු. 5ට වැඩි නොවන්නාවූ විට ... ... | 0 50 |
| (ඌ) රු. 5ට වැඩි වන්නාවූ එහෙත් රු. 10ට වැඩි නොවන්නාවූ විට ... ... | 1 00 |
| (එ) රු. 10ට වැඩිවූ විට— | |
| (1) 1 වැනි රු. 10ට ... ... | 1 00 |
| (2) ඊට වැඩිවූ එක් එක් රු. 5ට හෝ ඉන් කොටසකට ... ... | 1 00 |

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 සැප්තැම්බර් 16 වැනි දින,
කොළඹදීය.

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඕ—බී 247/40.
ඇල්.ජී.ඕ—ජී.ජී 11/7/3.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ගන්නෑව ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලය ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 සැප්තැම්බර් 24 දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

#### රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

1. (1) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ අය කරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත් වූ යම් රථවාහනයක් හෝ සතෙක් අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නා වූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛනයක් ප්‍රධාන තුමාට සැපයිය යුතුයි. මේ ෆෝර්ම ගම්කාර්‍ය සභා කාර්‍යාලයෙන් ලබාගත හැකිය.

(2) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1959 වර්ෂය වෙනුවෙන් "ඒ" උපලේඛනය සම්පූර්ණකොට 1959 ජනවාරි 31 වැනි දින හෝ ඊට මත්තෙන් හෝ ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි. එකී අය විසින් ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අය ගෙන් එබඳු උපලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛන සැපයුවාවූ සෑම අයෙක්ම නව දුරටත් දැනුම් දෙනු ලැබීමක් නැතිව

(අ) ඒ උපලේඛනයේ සඳහන් රථවාහන සහ සතුන් සඳහා වූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු 31 වැනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති. තවද,

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් "ඒ" උපලේඛනයේ සඳහන් කරන ලදුව, එකී වර්ෂයේ දවස් තිහකට වැඩි කාලයක් තමා අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන සහ සතුන් සඳහා වූ බද්ද එකී එක් එක් අවුරුද්දේ මාර්තු 31 වැනිදා හෝ ඊට මත්තෙන් ගෙවීමට යටත් වෙති.

3. (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාට පසු යම් කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූ ආඥාපනත යටතේ බද්දට යටත් වූ ද යම් රථවාහනයක් හෝ සතෙකු අත් පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් හෝ 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්නාවූ යම් කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතෙකු පළමුවන වරට අත් පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කර ගැනීමේ හෝ තබා ගැනීමට නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක් මාසයක් ඇතුළත දී සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛනයේ සඳහන් ෆෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ලකින් වූ දැන්වීමකින් එසේ අත් පත් කරගත් බව ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන් ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන් ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනයේ පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද ඒ සඳහා ප්‍රධාන තුමා විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාල සීමාවක් ඇතුළත දී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළා වූ හෝ උපලේඛනයේ සඳහන් කළා වූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් හේතු නිසා යයි දක්වෙන ලියවිල්ලකින් වූ දැන්වීමක් වහාම ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි.

(2) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයුවාට පසු ඒ රථවාහනය හෝ සතා තබා ගැනීමට හෝ පාවිච්චි කිරීම නතර කළා වූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියා වූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින් වූ දැන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම අත් හළ බැව් වහාම ප්‍රධාන තුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. (1) යම් කිසිවෙකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධාන තුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහනය වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් "බී" උපලේඛනයෙහි සඳහන් ෆෝර්මයේ ප්‍රකාරයට ඒ රථවාහනය සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරු ද තහඩුව නිකුත් කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම් ද රථවාහන රිජිස්ටරයේ ඒ ඒ රථවාහන පිළිබඳ වූ අංකය ද, සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි.

(2) එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් ඒ ප්‍රධාන තුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත පණහක් ගෙවූ විට ඔහුට අලුත් තහඩුවක් නැවත ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරාගෙන තිබෙන බව දිවුරුම් සහතිකයකින් හෝ වෙනයම් ලෙසකින් ප්‍රධාන තුමාට ඒත්තු ගැනීමට සැලැස්සුව හොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත හැටක් ගෙවනු ලැබූ විටත් අලුත් තහඩුවක් නිකුත් කළ හැකියි.

7. සෑම රථවාහනයකම එම අවස්ථාවේ අයිතිකරු විසින් හෝ භාරකරු විසින් 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවි කළ යුතුයි.

8. ප්‍රධාන තුමා විසින් හෝ ආදායම් ඕවර්සියර්වරයෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ ප්‍රධාන තුමාගෙන් ලියවිල්ලකින් බලයලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනාගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක් ද ඒ රථවාහන යෙහි 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේ ය. තවද ප්‍රධාන තුමා විසින් හෝ එබඳු වෙනත් නිලධාරියා විසින් ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක එම අවස්ථාවේදී භාරකාරයා විසින් හෝ රථය පදවන්නා විසින් හෝ රථය නවත්වා ප්‍රධාන තුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂාකර බැලීමට ඉඩ දිය යුතුයි.

9. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ;

"කාර්‍යසභාව" යනුවෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ගන්නෑව ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ;

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

## "ඒ" උපලේඛනය

### ෆෝරමය

අංකය ————.

ජන්දදායක කොට්ඨාශ අංකය :————.

උඩහේවාහැට ගන්නෑව ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව

රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් වූ අතුරු ව්‍යවස්ථා වල ප්‍රකාරයට සැපයිය යුතු රථවාහන හා/හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නම :————.

ගම :————.

| රථවාහන හා/හෝ සතුන් පිළිබඳ විස්තර | ගණන (වචන වලින්) | වෙනත් විස්තර (බයිසිකලයක් නම් සාදන ලද අයගේ නොම්මරය සඳහන් කරනු) |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ කරත්ත හැර වෙන ඕනෑම අන්දමක වාහන ... | | |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල ... ... | | |
| තනිගොනා බඳින බර කරත්ත හෝ තිරික්කල | | |
| ජින් රික්ෂෝ කරත්ත .... ... | | |
| අත් කරත්ත ... ... | | |
| බයිසිකල් ... ... | | |
| අලි ... ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... ... | | |

මගේ දැනීම හැටියට ඉහත සඳහන් ලේඛනය නිවැරදි බවටත්, සත්‍ය බවටත් සහතික කරමි.

————,
අයිතිකරුගේ අත්සන.

දිනය :————.

## "බී" උපලේඛනය

### ෆෝරමය

| | |
|---|---|
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ කරත්ත හැර වෙන ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... | ග. ග. වා. |
| ඕනෑම අන්දමක සෑම ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | ග. ග. බ. ක. |
| සෑම තනිගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | ග. ග. ක. |
| සෑම ජින් රික්ෂෝ කරත්තයක් යන සෑම අත් කරත්තයක් සඳහා ... ... | ග. ග. අ. ක. |
| සෑම බයිසිකලයක් සඳහා ... ... | ග. ග. බ. |

---

ඇල්. ජී. සී—ජීසී 14/23.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරිපිටිය ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

වර්‍ෂ 1958ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹදීය.

### අප්‍රසන්නවූ හා අන්තරාදායකවූ කර්මාන්ත

1. (1) පහත දක්වෙන කර්මාන්ත අන්තරාදායකවූ කර්මාන්ත

කොප්පරා වියලීම,
කබොක් ගල්, බොරළු හෝ කළු ගල් ලබා ගැනීමට ගල්වල් කැපීම,
කපාපු පොල් වියලා සකස් කිරීම,
කොප්පරා ගබඩා කිරීම,
මිරස් වියලා සකස් කිරීම හෝ ගබඩා කිරීම,
යංත්‍ර සූත්‍ර මාර්ගයෙන් හෝ සෙක්කුවෙන් පොල් තෙල් සිඳීම,
පැඟිරි තෙල් සිඳීම,
කෙඳි වර්ග තෙලීම සහ ගබඩා කිරීම,
කුරුඳු තෙල් සිඳීම,
කපු පුළුන්, නූල් ආදිය ගබඩා කිරීම,
ලී මඩුවක් තබා ගැනීම,
දර මඩුවක් තබා ගැනීම,
සවර්ණාභරණ සෑදීම,
කම්හලක් තබා ගැනීම,
භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම,
මුද්‍රණ යංත්‍රාලයක් තබා ගැනීම,
තේ කර්මාන්ත ශාලාවක් තබා ගැනීම,
අම්ලකර වායුව යොදා ලෝකුරු වැඩ කිරීම,
හාල් මෝලක් තබා ගැනීම,
බයිසිකල් අළුත් වැඩියා කිරීම සඳහාවූ වැඩපොළක් තබා ගැනීම,
මෝටර් රථ අළුත් වැඩියා කිරීම සඳහාවූ වැඩපොළක් තබා ගැනීම,
ගෘහ භාණ්ඩ සෑදීම,
සෝඩා, ලැමනේඩ් ආදී සිසිල් බීම වර්ග සෑදීම,
ලී ඉරන මෝලක් තබා ගැනීම,

(2) පහත දක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සළකනු ලැබේ:—

ජාඩි හෝ කරවල ගබඩා කිරීම,
තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුළු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
මිරිස් සහ වෙනත් තුන පහ වර්ග යංත්‍ර සූත්‍ර මාර්ගයෙන් ඇඹරීම,
කොම්පෝස්ට් පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීම,
විනාකිරි සෑදීම,
සබන් සෑදීම,
හම් පදම් කරන ස්ථානයක් තබා ගැනීම,
පුවක් වියලා සකස් කිරීම,
සතුන්ගේ ලේ හෝ මළකුණු උනු කිරීම,
සතුන්ගේ හම් ගබඩා කිරීම,
සතුන්ගේ ඇට කටු ගබඩා කිරීම,

මාළු අයිස් දැමීම,
ලෑලි පොහොර සකස් කිරීම,
රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හෝ සෑදීම,
කෘතිම පොහොර හෝ කෘතිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය හෝ ගෝනි තුනකට වඩා ගබඩා කිරීම,
සෝඩා සෑදීම,
දුම්කොළ වියලා සකස් කිරීම,
සුරුට්ටු සෑදීම,
පෑණි හකුරු සෑදීම,
රා එකතු කිරීමේ ස්ථානයක් තබා ගැනීම,
බීඩි සෑදීම,
පොල් ලෙලි පෙඟවීම පිණිස (පොල් ලෙලි කොටුවක්) තබා ගැනීම.

(3) පහත දැක්වෙන කර්මාන්ත අන්තරාදායකවූද, අප්‍රසන්නවූද කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

කෙඳි සායම් කිරීම,
ගඩොල් හෝ උළු පිලිස්සීම,
බැටරි චාජ් කිරීම,
හුණු ගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කුඩා කැබලිවලට කැඩීම,
අඟුරු සඳහා පොල් කටු පිළිස්සීම.

## අතුරු ව්‍යවස්ථා

### අශුචි ඉවත් කිරීම හා කශල ශෝධනය

2. කාර්‍ය සභාව විසින් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 6 වැනි කාණ්ඩයේ 6 වෙනි අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන කාරණා සඳහා කාර්‍ය සභාවට ගෙවිය යුතු අශුචි ඉවත් කිරීමේ මාසික ගාස්තුව, එක් එක් බාල්දිය සඳහා රුපියල් එක ගණනේ විය යුතු වන්නේය.

3. කාර්‍ය සභාව විසින් සම්මත කර ගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 6 වෙනි කාණ්ඩයේ 11 වෙනි අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන කාරණා සඳහා කාර්‍ය සභාවට ගෙවිය යුතු කශල ශෝධන මාසික ගාස්තුව ශත විසි පහක් වන්නේය.

4. මේ අතුරු ව්‍යවස්ථාවේ—

"කාර්‍ය සභාව" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරිපිටිය ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

---

ඇල්. ජී. ඩී—ජීසී 14/67.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නෑගම්පහ ගම් ප්‍රදේශයේ ගම් කාර්‍ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ "ගැසට්" අතිරේකයේ, පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

වර්ෂ 1958 සැප්තැම්බර් 19 දින,
කොළඹ.

## අතුරු ව්‍යවස්ථාව

(1) පහත දැක්වෙන කර්මාන්ත අන්තරායදායකවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

කොප්පරා සෑදීම,
කබුක් ගල්, බොරළු හෝ කළුගල් ලබා ගැනීමට ගල් වලවල් කැපීම,
කපාපු පොල් වියලා සකස් කිරීම,
කොප්පරා ගබඩා කිරීම,
පිදුරු ගබඩා කිරීම,
මීරන් වියලා සකස් කිරීම හෝ ගබඩා කිරීම,
යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් හෝ සෙක්කුවෙන් පොල් තෙල් හිඳීම,
පැණිරි තෙල් හිඳීම,
කෙඳි වර්ග තෙලීම හා ගබඩා කිරීම,
කුරුඳු තෙල් හිඳීම,
කපු පුළුන් නූල් ආදිය ගබඩා කිරීම,
ලී මඩුවක් තබා ගැනීම,
දර මඩුවක් තබා ගැනීම,
ස්වර්ණාභරණ සෑදීම,
කම්හලක් තබා ගැනීම,
භූමි තෙල් ගබඩාවක් තබා ගැනීම,
මුද්‍රණ යන්ත්‍රාලයක් තබා ගැනීම,
තේ කර්මාන්ත ශාලාවක් තබාගැනීම,
අම්ලකර වායුව පාවිච්චි කරන කම්හලක් තබා ගැනීම,
හාල් මෝලක් තබා ගැනීම,
බයිසිකල් අළුත් වැඩියාකිරීම සඳහා ස්ථානයක් තබා ගැනීම,
මෝටර් රථවාහන අළුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් තබා ගැනීම,
ගෘහ භාණ්ඩ සෑදීම,
සෝඩා, ලෙමනේඩ් ආදී සිසිල් බීම වර්ග සෑදීම.

(2) පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

ජාඩි හෝ කරවල ගබඩා කිරීම,
තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුළු ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම,
යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් මිරිස් හා වෙනත් කුළුබඩු වර්ග ඇඹරීම,
කොම්පෝස්ට් පොහොර හෝ කෘත්‍රිම පොහොර හෝ සෑදීම,
විනාකිරි සෑදීම,
සබන් සෑදීම,
හම් පදම් කරන ස්ථානයක් තබා ගැනීම,
පුවක් වියලා සකස් කිරීම,
සතුන්ගේ ලේ හෝ මළකුණු උණු කිරීම,
සතුන්ගේ හම් ගබඩා කිරීම,
සතුන්ගේ ඇට කටු ගබඩා කිරීම,
මාලු අයිස් දැමීම,
ලෑලි පොහොර සකස් කිරීම,
රබර් ෂීට් ක්‍රේප් රබර් දුම් ගැස්වීම හෝ සෑදීම,
කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය හෝ ගෝනි තුනකට වඩා ගබඩා කිරීම,
සෝඩා සෑදීම,
දුම්කොළ වියලා සකස් කිරීම,
සුරුට්ටු සෑදීම,
පැණි හකුරු සෑදීම,
රා එකතු කිරීමේ ස්ථානයක් තබා ගැනීම,
බීඩි සෑදීම,
පොල් ලෙලි පෙඟවීම පිණිස (පොල් ලෙලි) කොටුවක් තබා ගැනීම.

(3) පහත දැක්වෙන කර්මාන්ත අන්තරායදායකවූද, අප්‍රසන්නවූද කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

කෙඳි වර්ග සායම් කිරීම,
ගඩොල් හෝ උළු පිළිස්සීම,
බැටරි චාජ් කිරීම,
හුණු ගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කුඩා කැබලිවලට කැඩීම.

---

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කුංචුට්ටු කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමතකරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1958 සැප්තැම්බර් 24 දින
කොළඹ දීය.

## අතුරු ව්‍යවස්ථා

### පොදු මහජන සෞඛ්‍ය හා නගරාලංකාරය හා නොයික්මුනු ලෙස හැසිරීම

1. සෑම ගෙයක හෝ ඉඩමක අයිතිකාරයා විසින් හෝ පදිංචිකාරයා විසින් හෝ තම දේපල සුද්ද පවිත්‍ර ලෙසත්, එකී ගෙයි සිට යාර තිහක් දුරට හෝ තම ඉඩමේ මායිම ඊට අඩුනම් ඒ මායිම දක්වා හෝ සියලුම වල්පැලෑටි ඉතා බහුල ලෙස වැවෙන්නාවූ හෝ සනීපයට බාධකවූ ගස් කොළන් ආදියෙන් හා සියලුම කැලිකසල හෝ කුණු රොඩු හෝ මදුරුවන්ගේ බෝවීම ඇතිවිය හැකි භාජන යන මේවායින් තොරවත් තබාගත යුතුයි.

2. (1) යම්කිසි ගසක් හෝ ගසක අත්තක් හෝ ගෙඩියක් හෝ ගසක වෙනයම් කොටසක් යම්කිසි ගොඩනැගිල්ලකට අලාභ හානියක් සිදුවන හැටියට හෝ සිදුවන්ට පුළුවන්වන හැටියට හෝ යම්කිසි ගොඩනැගිල්ලක පදිංචිව සිටින අයට හෝ යම්කිසි දේපලකට හෝ යම්කිසි පොදු මාවතක ගමනාගමනය කරන අයගේ ආරක්ෂාවට හෝ යම්කිසි අනතුරු එලවිය හැකි, තත්ත්වයක පවත්නාවූ කොයියම් විටකදී වුවත්, ප්‍රධානතුමා විසින් ඒ ගස පිහිටි ඉඩමේ පදිංචි කාරයා වෙත හෝ අයිති කාරයා වෙත හෝ භාරකරණු ලබන ලියවිල්ලකින්වූ

(2) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ දැන්වීම හෝ සැපයුමට පසු ඒ රථවාහනය හෝ සතා තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින්වූ දැන්වීමකින්, තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත්හල බව වහාම ප්‍රධාන තුමා වෙත ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

6. යම් කිසිවකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධාන තුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහනය වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් "බී" උපලේඛනයෙහි සඳහන් ෆෝර්මයේ ප්‍රකාරයට ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද, තහඩුව නිකුත් කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම්ද, රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථවාහනය පිළිබඳවූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත්, ඒ තහඩුව අයිතිකාරයා විසින් ඒ ප්‍රධාන තුමාට ආපසු භාර දිය යුතුයි. තවද ඔහු විසින් සත පණහක් ගෙවූ විට ඔහුට අළුත් තහඩුවක් නැවත ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරාගෙන තිබෙන බව දිවුරුම් සහතිකයකින් හෝ වෙන යම් ලෙසකින් ප්‍රධාන තුමාට ඒත්තු ගැනීමට සැලැස්සුව හොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිට ඔහු විසින් සතහැටක් ගෙවනු ලැබූ විටත් අළුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

7. සෑම රථවාහනයක්ම අයිතිකරු විසින් හෝ භාරකරු විසින් 6 වැනි අතුරු ව්‍යවස්ථාව සටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවි කළ යුතුයි.

8. ප්‍රධාන තුමා විසින් හෝ ආදායම් ඔවර්සියර් වරයෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ ප්‍රධාන තුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනාගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක් හෝ රථවාහනයෙහි 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද ප්‍රධාන තුමා විසින් හෝ ආදායම් ඔවර්සියර් තැන විසින් හෝ පොලිස් නිලධාරියා විසින් හෝ ප්‍රධාන තුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ රථය පදවන්නා විසින් හෝ රථය නවත්වා ප්‍රධානතුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂා කර බැලීමට ඉඩ දිය යුතුයි.

9. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ;

"කාර්‍ය සභාව" යනුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ කුඹල්වෙල ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ;

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

## "ඒ" උපලේඛනය

**ෆෝර්මය**

අංකය : ........................

ජන්දදායක කොට්ඨාශ අංකය : ........................

**කුඹල්වෙල ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව**

රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන්වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයිය යුතු රථවාහන හා/* හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නම :————.

ගම :————.

| රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ විස්තර | ගණන (වචන වලින්) | වෙනත් විස්තර (බයිසිකලයක් නම් සාදන ලද අයගේ නොම්මරයසඳහන්කරනු) |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින්රික්ෂෝ කරත්ත හැර ඕනෑම අන්දමක වාහන... | | |
| ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල .... ... | | |
| තනිගොනා බඳින බර බාග හෝ තිරික්කල | | |
| ජින් රික්ෂෝ කරත්ත ... | | |
| අත් කරත්ත ... ... | | |
| බයිසිකල් ... ... | | |
| අලි .... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

මගේ දැනීමේ හැටියට ඉහත සඳහන් ලේඛනය නිවැරදි බව සහතික කරමි.

————,
අයිතිකරුගේ/*හෝ පාවිච්චි කරන්නාගේ අත්සන.

දිනය :————.

* නුවුවමනා වචන කපා දමනු.

## "බී" උපලේඛනය

**ෆෝර්මය**

| | |
|---|---|
| සෑම ගොන් දෙන්නා බඳින බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | කු. බ. ක. |
| සෑම තනිගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | කු. බා. ක. |
| සෑම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා | කු. ජි. රි. |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | කු. අ. ක. |
| සෑම බයිසිකලයක් සඳහා ... ... | කු. පා. පැ. |

# විවිධ දැන්වීම්

## කන්ද පල්ල කෝරළේ ගම්කාර්‍ය සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයේ 1959 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍රයක් ඉල්ලා ඉල්ලුම් පත්‍රයක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පණතේ (201 වැනි පරිච්ඡේදයේ) 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපණතේ 6 වැනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන කන්ද පල්ල කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඈ එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යනාවග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දවස් විසි අටක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| ඊ. බදුර්දීන්, පුවක්පිටිය, ගලේවෙල. ... | නාඹඩගහවත්තේ, ඉඟිරි ගහමුලවත්ත. |

ඊ. ඇම්. බී. රත්නායක,
කන්ද පල්ල කෝරළේ ගම්කාර්‍ය සභාවේ ප්‍රධානතැන.

23.9.58 වැනි දින,
ගලේවෙලදීය.

---

## හලාවත දිස්ත්‍රික්කයේ-යටකලන්පත්තු ගම්කාර්‍ය සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1958 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව හලාවත දිස්ත්‍රික්කයේ යටකලන් පත්තු ගම්කාර්‍ය සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| (1) ජයසූරිය ආරච්චිගේ ජේලිස් අප්පුහාමි, හත්තිනිය, මාරවිල. | තල්ගහවත්ත, ගංගොඩ, මාරවිල, (හරක් මස්) |

ඩබ්ලිව්. ඩබ්ලිව්. මැනිවු ප්‍රනාන්දු,
ගම්කාර්‍ය සභාපති.

ගම්සභා කාර්‍යාලය,
හත්තිනිය, මාරවිල.
24.9.58.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඩ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශණයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශණ, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඩ කරණු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා **1955 ජනවාරි 1 වැනි දින සිට** අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුවම අය කරණු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරණු ලැබේ.** ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරණ දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාලය වැඩ කරණ දින තුනකට ප්‍රථම **පස්වරු 4ට** සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් **කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති** තැනට ලැබෙන සේ **එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශණ කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... ... | එක් කාණ්ඩයක් සඳහා | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... ... | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේනම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ රජයේ ප්‍රකාශණ කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන්** ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී